විදේශ කටයුතු අමාත්‍යාංශය
வெளிநாட்டு அலுவல்கள் அமைச்சு
MINISTRY OF FOREIGN AFFAIRS
ජනරජ ගොඩනැගිල්ල, කොළඹ 1, ශ්‍රී ලංකාව குடியரசுக் கட்டிடம், கொழும்பு 1, இலங்கை Republic Building, Colombo 1, Sri Lanka

| | | |
|---|---|---|
| මගේ අංකය<br>எனது இல<br>My No | ඔබේ අංකය<br>உமது இல<br>Your No | දිනය<br>திகதி<br>Date 25/02/2016 |

## මාධ්‍ය නිවේදනය

විදේශ කටයුතු අමාත්‍ය මංගල සමරවීර මහතා, පෙබරවාරි 21-24 දින වලදී එක්සත් ජාතීන්ගේ මූලස්ථානයේ දී පැවති එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහනේ 50වැනි සංවත්සර සැමරුම්වලට සහභාගිවීම සඳහා නිව්යෝර්ක් හි තෙදින සංචාරයක නියැලිණි. අමාත්‍ය සමරවීර මහතා තම සංචාරයේ පළමු අංගය ලෙස එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහනේ පරිපාලකවරිය වන හෙලන් ක්ලාක් මැතිණිය සමග සුහද සාකච්ඡාවක නියැලුණු අතර එහිදී එතුමා 1960 වසරේ සිට මෙම සංවිධානයට ශ්‍රී ලංකා රජය හා එහි ජනතාව සමග පවත්වාගෙන ආ ප්‍රබල හවුල්කාරිත්වය පිළිබඳ අවධාරණය කළේය. ශ්‍රී ලංකාවේ වර්තමාන සාමය ගොඩනැගීමේ කටයුතු හමුවේ පැන නැගී ඇති සංවර්ධන අභියෝගවලින් ජය ගැනීමට මෙම සහයෝගිතාව තවදුරටත් වැඩිදියුණු කර ගත හැකි ආකාර පිළිබඳවද ඔවුහු මෙහිදී සාකච්ඡා කළහ.

ශ්‍රී ලංකාව සාමය ගොඩනැගීමේදී යොදා ගන්නා යාන්ත්‍රණ පිළිබඳව හා සාම සාධක කටයුතු සම්බන්ධයෙන් ලොව අනෙක් රටවල් සඳහා ශ්‍රී ලංකාව ලබා දෙන සහයෝගීත්වය පසු කිරීමට දරමින් සිටින ප්‍රයත්න පිළිබඳව සාකච්ඡා කිරීම සඳහා දේශපාලන කටයුතු දෙපාර්තමේන්තුවේ උප ලේකම් ජෙෆ්රි ෆෙල්ට්මන් මහතා සමඟද හමුවිය.

මංගල සමරවීර අමාත්‍යතුමා සහ ඇමරිකා එක්සත් ජනපදය, ඔස්ට්‍රියාව, ජපානය සහ දකුණු කොරියාව යන ප්‍රධාන ආධාර ලබා දෙන රටවල සාමාජිකයින් සඳහා ස්වීඩනයේ නිත්‍ය දූත මණ්ඩලය විසින් සත්කාරකත්වය දරන ලද දිවා භෝජනයකදී අමාත්‍යතුමා, පශ්චාත් ගැටුම් අවධියක පසුවන ශ්‍රී ලංකාවේ සාමය ගොඩනැගීමේ යාන්ත්‍රණය පිළිබඳව සහ එය වර්ධනය කිරීමේ වැදගත්කම පැහැදිලි කරමින් සියලු පාර්ශවකරුවන්ගේ ජීවන තත්වය යහපත් අතට පත් කිරීම උදෙසා සංවර්ධන කාර්යයන්හි නිරත වන බව ප්‍රකාශ කර සිටියේය.

සාමය හා සංවර්ධනය අතර ඇති සම්බන්ධය පරිපූර්ණමෙන්ම වේගවත් එකක් බව පැවසූ අමාත්‍යතුමන් සාමය සැම දෙනා අතරම බෙදී යන ශිඝ්‍රතාව අනුව එහි කල් පැවැත්මද ඉහල යන බව සඳහන් කළේය.

එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහනට අදාල අමාත්‍ය හමුවේ ප්‍රධාන සාමාජිකයකු වූ අමාත්‍ය මංගල සමරවීර මහතා එහි දී බී.බී.සී හි මැතිව් ප්‍රයිස් මහතා විසින් මෙහෙය වන ලද "සාහසික ගැටුම් වැලැක්වීම, සාමකාමී සමාජයක් ගොඩනැගීම" යන සැසිවාරයේදී සංවර්ධනය සහ සාමය අතර ඇති බැඳීම පහදා දෙන ලදී. 1948 ශ්‍රී ලංකාව නිදහස දිනා ගත් මොහොතේ ලෝකය අපගෙන් බොහෝ දේ බලාපොරොත්තු වූ බව අමාත්‍යතුමා පෙන්වා දුන්නේය. නැගෙනහිර ස්විට්සර්ලන්තය බවට පත් වෙමින් ශ්‍රී ලංකාව, යටත් විජිතභාවයෙන් නිදහස ලබන අනෙකුත් රටවලටද ආදර්ශයක් වනු ඇතැයි ලන්ඩන් ටයිම්ස් පුවත් පත අනාවැකි පල කළේය. කෙසේවෙතත් බහු ජාතික, බහු සංස්කෘතික, බහු ආගමික, සහ බහු භාෂා රටක් වශයෙන් ශ්‍රී ලංකාව සතු විවිධත්වය ප්‍රයෝජනයට ගත නොහැකි වීම නිසා අපට එම අවස්ථාව මග හැරී ගියේය.

මෙම දුක්ගැනවිලි ජාතිවාදී ප්‍රතිවිරෝධයන් වෙනස් කොට සලකන බවට වන හැඟීම් හා අසාධාරණ සැලකීම් බවට පරිවර්තනය වීමේ තත්වයන් නිර්මාණය කරන ලද්දේ, ශ්‍රී ලංකාවේ විවිධ ප්‍රජාවන්ගේ දුක්ගැනවිලි හදුනාගෙන ඒවා කළමනාකරණය කිරීමට අපොහොසත් වූ සමාජ හා දේශපාලන නායකයන් විසින් බව පැවසීය.

එම සාධාරණ දුක්ගැනවිලි කළමනාකරණය කිරීමට අපොහොසත් වීම හේතු කොට ගෙන ගැටුම් හා ප්‍රචණ්ඩත්වයට මඟ පැදුනු බව සදහන් කල අමාත්‍යවරයා, කාලයත් සමග ශ්‍රී ලංකාව එය අවබෝධ කරගෙන ඇති බව පැවසීය. ජාතික උපදේශන ක්‍රියාවලියන් මගින් සත්‍ය සෙවීමේ, සාධාරණත්වය, හානිපූරණය හා නැවත ගැටුම් ඇති නොවන බවට වග බලා ගැනීමේ ක්ෂේත්‍ර හතරට යොමුවීමේ ක්‍රමවේදය දැනටමත් ආරම්භ කොට ඇති බව සදහන් කරමින්, ශ්‍රී ලංකාවේ යාන්ත්‍රණ පිළිබඳව එතුමා පැහැදිලි කිරීමක් සිදු කළේය.

සිය සංචාරයේදී එතුමා අන්‍යෝන්‍ය වශයෙන් වැදගත් වන කරුණු සාකච්ඡා කිරීම සදහා නෝර්වීජියානු විදේශ කටයුතු අමාත්‍ය ගරු බෝර්ගේ බ්‍රෙන්ඩේ මහතා හා උපාය මාර්ග සංවර්ධන හා ස්කැන්ඩියානු සහයෝගීතාව පිලිබඳ අමාත්‍ය ක්‍රිස්ටිනා පර්සන් මහත්මියද හමුවිය.

අමාත්‍යතුමා තීරණාත්මක සහයෝගිත්ව සංවාදයට පෙර සාකච්ඡා සදහා එක්සත් ජාතීන්ගේ ඇමෙරිකා එක්සත් ජනපද නිත්‍ය නියෝජිත, තානාපතිනි සැමන්තා පවර් මහත්මිය හා නියෝජිත, තානාපතිනි මිෂෙල් සිසන් මහත්මිය මෙම සතියේ පසු භාගයේදී වොෂින්ටන් හිදී හමුවිය.

නිව් යෝර්ක් හි එක්සත් ජාතීන්ගේ ශ්‍රී ලංකා නිත්‍ය දූත මණ්ඩලය,
820, 2 වන පටුමග, 2 වන මහල,
නිව් යෝර්ක් 10017.
25.02.2016


| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 2325371-5 | ෆැක්ස්<br>பெக்ஸ்<br>Fax | 2333450<br>2446091<br>2430220 | ඊ - මේල්<br>மின்அஞ்சல்<br>E-Mail | cypher@mea.gov.lk | වෙබ් අඩවිය<br>இணைய தளம்<br>Web site | www.mea.gov.lk |